සැ. යු. - (i) 2020.10.16 වැනි දින අංක 2198 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2020 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවන්ගෙන් පළවේ.
(iii) 2020.10.20 වැනි අඟහරුවාද දින අංක 2198/13 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ "ශ්‍රී ලංකාව සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම පිණිස මහජන අදහස් ලබා ගැනීමට කරනු ලබන ආරාධනය" පිළිබඳ අධිකරණ අමාත්‍යාංශය පළකරන ලද නිවේදනය පළවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,199 - 2020 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා - 2020.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1186 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | 1191 |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1201 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


සැ. යු.- (i) විසර්ජන (2020) පනත් කෙටුම්පත 2020 ඔක්තෝබර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.
(ii) විසර්ජන (2021) පනත් කෙටුම්පත 2020 ඔක්තෝබර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.
(iii) සාක්ෂි (සංශෝධන) පනත් කෙටුම්පත 2020 ඔක්තෝබර් මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 නොවැම්බර් මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ඔක්තෝබර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1185 – B 82071 — 402 (2020/10)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2020 අංක 893

MOD/DEF/HRM/05/AF/PRO/04/20/(25).

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර එයාර් කොමඩෝර් නිලයට උසස් කෙරේ.

තාවකාලික එයාර් කොමඩෝර් චමින්ද වික්‍රමරත්න (01783) පරි/රෙජී 2020.09.10

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

10 - 894/1

---

2020 අංක 894

MOD/DEF/HRM/05/AF/PRO/3T/20/(57).

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ගෲප් කැප්ටන් නිලයට උසස් කෙරේ.

ස්ථිර විංග් කමාන්ඩර් ක්‍රිශාන්ත මංජුල ප්‍රදීප් හේවාපතිරණ (02003) ගු.තො.නි 2020.10.02

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

10 - 894/2

---

2020 අංක 895

MOD/DEF/HRM/05/AF/RET/20/(34).

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2021 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දනුම් දෙනු ලැබේ.

විංග් කමාන්ඩර් හර්ෂ හදික ප්‍රනාන්දු (02318) - කාර්මික ඉංජිනේරු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

10 - 894/3

---

2020 අංක 896

MOD/DEF/HRM/05/AF/RET/20/(33).

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2021 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නා ලද බව මෙයින් දනුම් දෙනු ලැබේ.

විංග් කමාන්ඩර් දොන් ලෂන්ක අසිත මානගේ (02331) - කාර්මික ඉංජිනේරු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

10 - 894/4

2020 අංක 897

MOD/DEF/HRM/05/AF/PRO/02/20/(59).

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර විංග් කමාන්ඩර් නිලයට උසස් කෙරේ.

තාවකාලික විංග් කමාන්ඩර් රුප්පගේ මිලාන් ප්‍රියදර්ශන සිල්වා (02515) පරිපාලන 2020.10.04

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

10 - 894/5

---

MOD/DEF/HRM/05/AF/WTD/20/(13).

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉවත් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදා අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කොට ඇත.

ස්කොඩ්රන් ලීඩර් ඉලේකුට්ටිගේ නියෝමාල් යොහාන් වර්ණකුළසූරිය (02698) සැපයුම් - 2020.07.25

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

10 - 894/6

2020 අංක 898

MOD/DEF/HRM/05/AF/RES/20/(3).

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

2020 සැප්තැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කොට ඇත.

ස්කොඩ්රන් ලීඩර් වීරසූරිය මුදියන්සේලාගේ ගැමුණු කුමාර වීරසූරිය (02956) - තොරතුරු තාක්ෂණ ඉංජිනේරු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

10 - 894/7

---

2020 අංක 899

MOD/DEF/HRM/05/AF/PRO/01/20/(24).

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර ස්කොඩ්රන් ලීඩර් නිලයට උසස් කෙරේ.

තාවකාලික ස්කොඩ්රන් ලීඩර් කලංචි දේවගේ කුසුම්සිරි ලාල් ජයන්ත (02611) ගු.තො.නි. 2020.09.02

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

10 - 894/8

2020 අංක 900

MOD/DEF/HRM/05/AF/PRO/IT/20/(21).

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ස්කොඩ්රන් ලීඩර් නිලයට උසස් කෙරේ.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් කරුණාරත්න මුදියන්සේලාගේ අසංක සංජීව කරුණාරත්න (03385) සැපයුම් 2020.09.06

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

10 - 894/9

---

2020 අංක 901

MOD/DEF/HRM/05/AF/PRO/IT/20/(28-30).

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට තාවකාලික ස්කොඩ්රන් ලීඩර් නිලයට උසස් කෙරේ.

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් ජෝතිරත්නගේ තිසර මධුසංක චන්ද්‍රසේන (03205) විද්‍යුත්/ඉංජි 2020.10.27

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් වීරසිංහ ආරච්චිගේ ලහිරු සඳුනික වීරසිංහ (03206) තො.තා./ඉංජි 2020.10.27

ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් අප්පු හෙන්දි තොටහේවගේ ගයාන් ද සිල්වා (03207) විද්‍යුත්/ඉංජි 2020.10.27

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

10 - 894/10

---

2020 අංක 902

MOD/DEF/HRM/05/AF/PRO/02/20/(26).

**ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
උසස් කිරීම්

පහත නම සඳහන් ස්වේච්ඡා නිලධාරියා ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ස්ථිර විංග් කමාන්ඩර් නිලයට උසස් කෙරේ.

තාවකාලික විංග් කමාන්ඩර් ඒකනායක මුදියන්සේලාගේ නාලක ඒකනායක (වි/0495) - කාර්මික ඉංජිනේරු ශාඛාව 2020.10.02

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

10 - 894/11

2020 අංක 903

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

*2015 දෙසැම්බර් මස 01 වැනි දින සිට මේජර් නිලයට :*

නි/3916 කපිතන් (තාවකාලික මේජර්) ජසෙන්තු නම්බි ප්‍රශන්ත රෝහිතලාල් රත්නප්‍රිය

නි/4258 තපිතන් (තාවකාලික මේජර්) ඇල්ලලගොඩ ගමගේ ජයතිලක

*2015 දෙසැම්බර් මස 31 වැනි දින සිට මේජර් නිලයට :*

නි/5711 කපිතන් (තාවකාලික මේජර්) නිලන්ත ගුරුසිංහ

*2016 ජූලි මස 20 වැනි දින සිට මේජර් නිලයට :*

නි/4705 කපිතන් (තාවකාලික මේජර්) වාසළ මුදියන්සේලාගේ මහසෙන් ප්‍රේමරත්න

නි/5782 තපිතන් (තාවකාලික මේජර්) කැප්පෙටිමුදුන ගෙදර අරුණ ශාන්ත කැප්පෙටිමුදුනගේ

*2016 අගෝස්තු මස 31 වැනි දින සිට මේජර් නිලයට :*

නි/4820 කපිතන් (තාවකාලික මේජර්) සමරකෝන් ගෙදර දොන් හෙන්රි නියුටන් රොහාන්

නි/5785 කපිතන් (තාවකාලික මේජර්) ලියනගේ නන්දන සමන්සිරි

*2016 සැප්තැම්බර් මස 15 වැනි දින සිට මේජර් නිලයට :*

නි/3936 කපිතන් (තාවකාලික මේජර්) සාගරිකා චාන්දනී ප්‍රසාදිකා රාමසිංහ (ගැ)

*2017 අගෝස්තු මස 31 වැනි දින සිට මේජර් නිලයට :*

නි/4849 කපිතන් (තාවකාලික මේජර්) වැලිකල අප්පුහාමිලාගේ දොන් ජගත් විශ්වමූර්ති පීටර් වැලිකල

*2017 දෙසැම්බර් මස 31 වැනි දින සිට මේජර් නිලයට :*

නි/3461 කපිතන් (තාවකාලික මේජර්) අඹවත්ත හේරත් ආරච්චිගේ හේමලතා රණසිංහ (ගැ)

නි/3523 කපිතන් (තාවකාලික මේජර්) පැලවත්ත විතානලාගේ කපිල කුමාරසිරි

නි/3799 කපිතන් (තාවකාලික මේජර්) සොලොහක්කාර මුදියන්සේලාගේ ආනන්ද ජයතිලක

නි/3990 කපිතන් (තාවකාලික මේජර්) ගල්හේනගේ රුවන් දීපාල් අල්විස්

නි/4126 කපිතන් (තාවකාලික මේජර්) රාජපක්ෂ පතිරන්නැහැලාගේ ඉන්දික පුෂ්ප කුමාර

නි/4541 කපිතන් (තාවකාලික මේජර්) ගමගෙදර මහමුදියන්සේලාගේ ටිකිර බණ්ඩාර ගමගෙදර

නි/4807 කපිතන් (තාවකාලික මේජර්) බස්නායක මුදියන්සේලාගේ මැදඇස්සැද්දුමේ ගෙදර ගුණතිලක

නි/4845 කපිතන් (තාවකාලික මේජර්) ගමාරච්චි පතිරණගේ අජිත් සමන්ත පතිරණ

නි/5375 කපිතන් (තාවකාලික මේජර්) දිසානායක මුදියන්සේලාගේ සෙනෙවිරත්න බණ්ඩාර දිසානායක

නි/5696 කපිතන් (තාවකාලික මේජර්) කරුණාරත්නගේ ප්‍රියන්ත ගමගේ

නි/5928 කපිතන් (තාවකාලික මේජර්) දිසානායක මුදියන්සේලාගේ සමන්ත බණ්ඩාර දිසානායක

නි/5935 කපිතන් (තාවකාලික මේජර්) අබේකෝන් විජයපක්ෂ නාරායන මුදියන්සේලාගේ සරත් කුමාර අබේකෝන්

නි/5339 කපිතන් (තාවකාලික මේජර්) වැලිවේරිය ලියනගේ කුශාන් ඉන්ද්‍රජිත් ලියනගේ

නි/5946 (කපිතන් (තාවකාලික මේජර්) බම්මනගේ උපාලි තිලකරත්න

නි/6039 කපිතන් (තාවකාලික මේජර්) බෝයගම රාලලාගේ චන්ද්‍රකාන්ත ජයරත්න

නි/6044 කපිතන් (තාවකාලික මේජර්) රාජපක්ෂ දේවගේ අජිත් සමන් රාජපක්ෂ

නි/6045 කපිතන් (තාවකාලික මේජර්) හේවා ගීගනගේ ලලිත් ප්‍රියන්ත

නි/6051 කපිතන් (තාවකාලික මේජර්) වන්නිනායක මුදියන්සේලාගේ රංජිත් බණ්ඩාර වන්නිනායක ආර්එස්පී

නි/6055 කපිතන් (තාවකාලික මේජර්) වජිර ප්‍රසන්න ප්‍රේමරත්න විදානපතිරණ

නි/6059 කපිතන් (තාවකාලික මේජර්) දිසානායක මුදියන්සේලාගේ සරත් කුමාර දිසානායක

නි/6062 කපිතන් (තාවකාලික මේජර්) ප්‍රදීප් නිශ්ශංක අමරසිංහ

*2018 සැප්තැම්බර් මස 30 වැනි දින සිට මේජර් නිලයට :*

නි/3650 කපිතන් (තාවකාලික මේජර්) රවීන්ද්‍ර කුමාර වීරසුන්දර

නි/4719 කපිතන් (තාවකාලික මේජර්) රූපසිංහ ආරච්චිගේ සජීව ජගත් කුමාර රූපසිංහ

නි/4819 කපිතන් (තාවකාලික මේජර්) අබේසිංහ මුදියන්සේලාගේ කෝරලේගෙදර චමින්ද පුෂ්ප කුමාර අබේසිංහ

නි/5227 කපිතන් (තාවකාලික මේජර්) මැලෑගොඩ ගමගේ අනුර කාන්ත

නි/5247 කපිතන් (තාවකාලික මේජර්) සෙල්ලප්පුලිගේ ටයිටස් ජෙරාඩ් සෙන්ස්ටස් රෝසා

නි/5261 කපිතන් (තාවකාලික මේජර්) බටුකන්දගේ දොන් කමනල් ගාමිණි සමරනායක

නි/5350 කපිතන් (තාවකාලික මේජර්) මුදුන් කොටුවගේ සනත් පුෂ්ප කුමාර

නි/5354 කපිතන් (තාවකාලික මේජර්) නවරත්න මුදියන්සේලාගේ උපුල් දමයන්ත බණ්ඩර නවරත්න

නි/5356 කපිතන් (තාවකාලික මේජර්) පුවක්පිටියේ දොන් ප්‍රසන්න අරුණ කුමාර විතානගේ
නි/5687 කපිතන් (තාවකාලික මේජර්) වන්නි ආරච්චි කංකානම්ගේ දයාසිලි (ගැ)
නි/5694 කපිතන් (තාවකාලික මේජර්) ප්‍රින්ස් රවින්ද්‍රසිරි ජයසූරිය
නි/5774 කපිතන් (තාවකාලික මේජර්) සමරකෝන් මුදියන්සේලාගේ ශාන්ත පාලිත බණ්ඩාර සමරකෝන්
නි/5792 කපිතන් (තාවකාලික මේජර්) හේරත් මුදියන්සේලාගේ සමර කුමාරදාස හේරත්
නි/5794 කපිතන් (තාවකාලික මේජර්) වැදිමුණ මුදියන්සේලාගේ සුනිල් අමරතුංග
නි/5795 කපිතන් (තාවකාලික මේජර්) තේවර ආරච්චිලාගේ උපාලි සෙනෙවිරත්න
නි/5943 කපිතන් (තාවකාලික මේජර්) හේරත් මුදියන්සේලාගේ විමලරත්න
නි/6038 කපිතන් (තාවකාලික මේජර්) සංජය මල්ලිකාරත්න
නි/6041 කපිතන් (තාවකාලික මේජර්) නවරත්න මුදලිගේ නිශ්ශංක තිලකරත්න
නි/6047 කපිතන් (තාවකාලික මේජර්) රාජපක්ෂගේ සුජිත් සංජීව රාජපක්ෂ
නි/6048 කපිතන් (තාවකාලික මේජර්) බෙන්තොට පේඩිගේ චන්දන උදේනි කුමාර
නි/6063 කපිතන් (තාවකාලික මේජර්) රන්කිරි පතිරෙන්නැහැලාගේ නිලන්ත චන්ද්‍රසේකර
නි/6094 කපිතන් (තාවකාලික මේජර්) වික්‍රම ආරච්චිලාගේ ජගත් කුමාරසිංහ
නි/6096 කපිතන් (තාවකාලික මේජර්) හේරත් මුදියන්සේලාගේ නන්හාමිගේ සමන් සෙනෙවිරත්න
නි/6098 කපිතන් (තාවකාලික මේජර්) ඒකනායක මුදියන්සේලාගේ පල්ලෙ ගෙදර ගාමිණි උදය කුමාර ඒකානායක
නි/6108 කපිතන් (තාවකාලික මේජර්) සෝලංග ආරච්චිගේ මලින්ද පිරිස්
නි/6116 කපිතන් (තාවකාලික මේජර්) පොල්වත්තේ ගෙදර විපුල් කුමාර ටිකිරි බණ්ඩාර
නි/6119 කපිතන් (තාවකාලික මේජර්) ඉහලගෙදර හේරත් මුදියන්සේලාගේ චන්දික ජානක කුමාර හේරත්

*2018 ඔක්තෝබර් මස 01 වැනි දින සිට මේජර් නිලයට :*

නි/6103 කපිතන් (තාවකාලික මේජර්) විජයලත් රාලලාගේ අශෝක මහානාම සෙනෙවිරත්න
නි/6239 කපිතන් (තාවකාලික මේජර්) දිසානායක මුදියන්සේලාගේ නිමල් ධර්මසේන බණ්ඩාර
නි/6244 කපිතන් (තාවකාලික මේජර්) මාන්නප්පෙරුම මුදියන්සේලාගේ මහින්ද හේරත් කුඩාමිතව
නි/6268 කපිතන් (තාවකාලික මේජර්) බෝගොඩ ගෙදර රුවනි තුෂාරි කුමාරසිංහ (ගැ)

*2019 මැයි මස 15 වැනි දින සිට මේජර් නිලයට :*

නි/5784 කපිතන් (තාවකාලික මේජර්) අධිකාරි මුදියන්සේලාගේ ආනන්ද සෙනෙවිරත්න
නි/6057 කපිතන් (තාවකාලික මේජර්) අතුකෝරලලාගේ ධම්මික ප්‍රියදර්ශන
නි/6295 කපිතන් (තාවකාලික මේජර්) ඉනිමංකඩ කංකානම්ගේ මහේෂ් රංජන ඉනිමංකඩ
නි/6297 කපිතන් (තාවකාලික මේජර්) කුසුම්සිරි විජේගුණවර්ධන

*2019 ජූනි මස 04 වැනි දින සිට මේජර් නිලයට :*

නි/5917 කපිතන් (තාවකාලික මේජර්) අතුල විජයවර්ධන නානායක්කාර

*2019 සැප්තැම්බර් මස 15 වැනි දින සිට මේජර් නිලයට :*

නි/5783 කපිතන් (තාවකාලික මේජර්) පරණමානගේ දිනේෂ් මිල්රෝයි
නි/5798 කපිතන් (තාවකාලික මේජර්) සුරසිංහ මුදියන්සේලාගේ උපුල් නිශාන්ත සුරසිංහ
නි/5800 කපිතන් (තාවකාලික මේජර්) මෙනේරිපිටියගේ දොන් සුනිල් ජයසිංහ
නි/6240 කපිතන් (තාවකාලික මේජර්) සුරේෂ් ප්‍රසන්න විදානගමගේ
නි/6266 කපිතන් (තාවකාලික මේජර්) ලිවේරා මුදලිගේ පමෝධා ගංගානි ද ලිවේරා (ගැ)
නි/6294 කපිතන් (තාවකාලික මේජර්) කුරුප්පු ආරච්චිගේ සම්පත් චාමින්ද ඇලෙක්සැන්ඩර්
නි/6310 කපිතන් (තාවකාලික මේජර්) මදවම් ආරච්චිගේ අතුල චන්දිම
නි/6319 කපිතන් (තාවකාලික මේජර්) මොහොමඩ් වඩුඩ් මොහොමඩ් අලිසබ්රි
නි/6320 කපිතන් (තාවකාලික මේජර්) කපුරුගේ දොන් රංජිත් නිශාන්ත කපුරුගේ
නි/6333 කපිතන් (තාවකාලික මේජර්) සුනිත් මලින්ද කරුණාරත්න
නි/6338 කපිතන් (තාවකාලික මේජර්) චාමින්ද සඳසෙන් සමරකෝන්
නි/6340 කපිතන් (තාවකාලික මේජර්) හේවා වඩුගේ සුමුදු ගීතානන්ද වසන්තාරත්න

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී,
මේජර් ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

10 - 791

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## මොරටුව විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මොරටුව විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම, හැර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර වත්කම්වල දක්වෙන පුස්තකාල පොත් 2013 වර්ෂයෙන් පසුව භෞතිකව පරීක්ෂණයක් සිදුකර නොමැත. තවද ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 276,364,317ක් වූ දේපළ, පිරියත හා උපකරණ 2018 දෙසැම්බර් මස 31 වැනි දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ හේතුවෙන් ප්‍රයෝජනාත්මක ජීවිත කාලය තක්සේරු කිරීමේදී වූ දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය විසින් බාහිර ආයතනයකට විරුද්ධව රු. මිලියන 05ක වන්දි ඉල්ලා මොරටුව දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර එම නඩුවේ විත්ති පාර්ශවය විසින් එම නඩුව සම්බන්ධව මහාධිකරණයට ඇපෑලක් ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08හි 100 වගන්තිය අනුව හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

(ඇ) නඩත්තු ගබඩාවෙහි 2018 දෙසැම්බර් මස 31 වැනි දිනට පවතින තොගය සත්‍යාපනය කර, වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණ රු. 6,951,712ක් වූ වෙනත් ලැබීම්වල ශුද්ධ වටිනාකම සනාථ කරන උපලේඛනය හෝ අදාළ සාක්ෂි, විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(ඉ) විශ්වවිද්‍යාලය තුළ පවත්වාගෙන යනු ලබන යුනි කන්සල්ටන්සි නමින් වන පෞද්ගලික ආයතනයට විශ්වවිද්‍යාලය විසින් මාසිකව කුලී පදනමට ලබාදී තිබූ ගොඩනැගිල්ලට අදාළ බදුකුලී ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඊ) 2018 වර්ෂයේ පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්වල විවිධ වැඩ සඳහා වෙන්කල රුපියල් මිලියන 42.06කින් වැය විෂයයන් 2ක් හැර වටිනාකම වූ රු. 39,344,250ක් වූ ඉතිරි වැඩ විෂයන්ගෙන් ක්‍රියාත්මක වූ ව්‍යාපෘති පිළිබඳ කිසිදු ලිපි ගොනුවක් විගණනයට ඉදිරිපත් නොවුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උපවගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තව ද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාත්මක මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවෙන්නේ නම් මාගේ මතය විගණනය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූලය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වී තිබුණි.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමාකිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

විශ්වවිද්‍යාලය තුළ පිහිටුවා ඇති යුනි කන්සල්ටන්සි සමාගමේ ව්‍යවස්ථාවලියෙහි, පාලක මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ලෙස විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී සහ ලේඛකාධිකාරී නම් කර තිබුණි.

2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූලවව නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

ප්‍රමාණාත්මක අනුකූල නොවීම් පහත දැක්වේ :

| *නීති, රීති විධානයට යොමුව* | *විස්තරය* |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 21 (ආ) | මුදල් රෙගුලාසිය ප්‍රකාරව, ඒකක පිරිවැය රු. 5,000,000 ඉක්මවන ඇස්තමේන්තුගත ව්‍යාපෘති හෝ වැඩ විෂයයන් සාමූහික ප්‍රතිපාදන ලෙස නොව වෙන වෙනම විෂයගත කොට ඇස්තමේන්තුවල පෙන්නුම් කළ යුතු වුවද, 2018 වර්ෂයේ පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 42.06ක් වූ විවිධ වැඩ සාමූහික ප්‍රතිපාදන ලෙස ඇස්තමේන්තුවල ඉදිරිපත් කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 (2) ආ | වාර්ෂික සමීක්ෂණය සඳහා පත්කරනු ලබන සමීක්ෂණ මණ්ඩල නිලධාරීන් දෙදෙනාගෙන් එක් අයෙකු හෝ එම භාණ්ඩ පිළිබඳ දැනුමක් ඇති අයෙකු විය යුතුය. එසේ දැනුමක් ඇති නිලධාරියෙකු නොමැති විට වෙනත් ස්ථානයකින් සමීක්ෂණ නිලධාරියෙකු ගෙන්වා ගැනීමේ හැකියාවක් පවතින බව මුදල් රෙගුලාසි 756 (2) ආ ප්‍රකාරව සඳහන් කර තිබුණ ද එවැනි සහභාගීත්වයක් හෝ සහිතව වෛද්‍ය මධ්‍යස්ථානයෙහි ඖෂධ සමීක්ෂණය කර නොතිබුණි. 2019 ජනවාරි 07 දිනැතිව ප්‍රධාන වෛද්‍ය නිලධාරීවරයාගේ තොග සත්‍යාපන වාර්තාවට අනුව රු.. 537,318ක වටිනාකම අවසන් ගිණුම්වල ඇතුළත් කර තිබුණි. |

| *නීති, රීති විධානයට යොමුව* | *විස්තරය* |
|---|---|
| (ආ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ | |
| (i) 1978 දෙසැම්බර් මස 19 දිනැති අංක 842 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | චක්‍රලේඛයට අනුව ආයතනය සතුව පවතින ස්ථාවර වත්කම් සම්බන්ධ සියලු විස්තර ඇතුළත් කරමින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යා යුතු වුවද එවැනි ලේඛනයක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. |
| (ii) 2002 නොවැම්බර් මස 28 දිනැති අංක IAI/2002/02 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතන සතු පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කළ යුතු අතර පරිගණක යන්ත්‍ර මිළදී ගැනීම, භාරකත්වය, නඩත්තුව, අළුත්වැඩියා කිරීම සහ අපහරණය කිරීම් යනාදී සියලු විස්තර එහි සටහන් කළ යුතුය. නමුත් විශ්වවිද්‍යාලය විසින් එවැනි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) විශ්වවිද්‍යාල කොමිෂන් සභා මුල්‍ය චක්‍රලේඛ ලිපි | |
| මුල්‍ය චක්‍රලේඛ ලිපි : ලිපි අංක 05/2017 | වාර්ෂික අයවැය හරහා විශ්වවිද්‍යාලයේ ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් අරමුදල් වෙන්කිරීම් ක්‍රියාවලියේ දී විශ්වවිද්‍යාල කොමිෂන් සභා මුල්‍ය චක්‍රලේඛ ලිපි අංක 05/2017 හි (3) පරිච්ඡේදයේ නියාමනයන් ගෙන් බැහැරව ක්‍රියාකර ඇති බවත් ප්‍රාග්ධන ව්‍යාපෘති වෙනුවෙන් මුල්‍ය වෙන්කිරීමේ ක්‍රියාවලිය නිසි අධීක්ෂණයකින් හා විනිවිදභාවයකින් ක්‍රියාත්මක වී නොමැති බවත් නිරීක්ෂණය විය. |

2.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකුල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 15ක් සහ ජාතික විද්‍යා පදනමෙන් රුපියල් මිලියන 25ක මූලික දායකත්වයෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු නිර්මාණ අංශයට පරිත්‍යාග සේ ලැබුණු රුපියල් මිලියන 40ක් වටිනාකමැති Digital Rapid Prototyping and Manufacturing System Viper යන්ත්‍රය 2015 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2019 ජනවාරි මස 11 වැනි දින දක්වා ඌන උපයෝජිතව පැවතුන අතර නියමිත කාලයට සේවා නඩත්තු නොකිරීම හේතුවෙන් යන්ත්‍රය අක්‍රීය තත්ත්වයට පත්වී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයට Lease Line Access පහසුකම ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපසභාපති හා තවත් විශ්වවිද්‍යාල ආචාර්යවරු සාමාජිකත්වය දරන LEARN නමැති පෞද්ගලික සමාගමෙන් මෙම සේවාව ලබාගෙන 2016 සිට 2018 වර්ෂය දක්වා පිළිවෙළින් රු. 33,430,467ක්, රු. 41,650,975ක්, රු. 47,215,767 ක් හා රු. 34,188,337ක් අදාළ සමාගමට ගෙවා තිබුණි. මෙම සේවාව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් ලබාගැනීමට හැකියාව තිබූ නමුත් ඒ පිළිබඳ නිසි ඇගයීමක් නොකර අදාළ සමාගමෙන් මෙම සේවාව ලබාගෙන තිබුණි.

(ඇ) යුනි කන්සක්ටන්සි සමාගමට නෛතික රාමුවක් ඇතිකර ගැනීම සඳහා පොදු ව්‍යාපාර කාරක සභාව විසින් විශ්වවිද්‍යාලයට කැබිනට් අනුමතියක් ලබා ගන්නා ලෙස නියෝග කර ඇති නමුත් මේ දක්වා එසේ කර නොතිබුණි.

(ඈ) ද්‍රව්‍ය විද්‍යා සහ ඉංජිනේරු දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල (Material Science and Engineering Department Building) ඉදිකිරීම සඳහා Design and Build පදනම මත අවශ්‍ය ලංසු ලියවිලි සකස් කිරීම දැනුවත් පුද්ගලයන් විශ්වවිද්‍යාලය තුළ සිටියදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ උපදෙස්වලට පටහැනිව රු. 752,000ක් වැයකර පිටස්තර ආයතනයකින් එම සේවාව ලබාගෙන තිබුණි.

(ඉ) මුල් ඇස්තමේන්තුව රුපියල් 159.7ක් වූ බහු කාර්ය සඳහා වූ ඉංජිනේරු පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම 2014 වර්ෂයේ ආරම්භ කර අවසන් කළ යුතුව තිබුණේ 2015 පෙබරවාරි මස 25 වැනි දින දී ය. කොන්ත්‍රාත්තුව 2016 දෙසැම්බර් මස 25 වැනි දින තවදුරටත් ඉටුකළ යුතු වැඩ කොටස් තිබියදී ආපසු භාරදී තිබුණි. ඒ වන විට ගොඩනැගිල්ල සඳහා රු. මිලියන 168.2ක් ගෙවා තිබුණ ද මෙම ඉතිරි වැඩ සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට නොහැකිවී තිබුණි.

(ඊ) 2014 ලබාදී තිබුණු රුපියල් මිලියන 143.9ක් ඇස්තමේන්තුගත වටිනාකමකට වාස්තු විද්‍යා දේශනශාලා ගොඩනැගිල්ල මෙ දක්වා ප්‍රයෝජනායට ගෙන නොතිබුණි.

(උ) විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය ආපනශාලා තුළින් බැහැර කරන ආහාර අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම මගින් ජීව වායුව නිෂ්පාදනය කර එම වායුව ආපනශාලාවල ආහාර පිසීම සඳහා භාවිතා කිරීම ජීව වායු පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රුපියල් මිලියන 1.3ක් ගෙවා තිබුණ නමුත් ඉදිකිරීම් දෝෂ නිසා තවදුරටත් නිශ්ක්‍රීයව පැවතුණි.

(ඌ) විශ්වවිද්‍යාලයේ නව පරිපාලන ගොඩනැගිල්ලට යාබද, කාර්මික ඉංජිනේරු ගොඩනැගිල්ලට ඉදිරියෙන් දිවා සුරැකුම් මධ්‍යස්ථානය දක්වා වන උද්‍යාන අලංකරණය වෙනුවෙන් රු. 3,093,310ක් වූ කොන්ත්‍රාත්තුව පුද්ගලික සමාගමක් වෙත ලබාදී 2017 ඔක්තෝබර් මස 17 වැනි දින නිමකළ යුතුව තිබුණ අතර මෙම කොන්ත්‍රාත්තුව අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2, 2016 ජනවාරි මස 25 දිනැති ප්‍රසම්පාදන අත්පොතේ අතිරේක 29හි 5.4.8, 8.12.1 (අ), 5.4.13 (අ), 8.13.4 පරිදි ක්‍රියාකර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් එහි කටයුතු නිමකර නොතිබුණි.

(එ) 2013 වර්ෂයේ ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 30ක් වැයකර ඇතත් මේ දක්වා අදාළ කාර්යයන් නිසි ලෙස නිම නොකිරීම නිසා පුහුණුවීමට හා තරග පැවැත්වීමට බාහිර ක්‍රීඩා පිටි කුලියට ගැනීමට සිදුවී තිබුණි.

(ඒ) 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙහි අන්තර්ගත නොවුණු රුපියල් මිලියන 12.8 වූ කොන්ත්‍රාත් 09ක් 2018 වර්ෂයේ දී ක්‍රියාත්මක කර තිබුණි. 2018 මුල්‍ය වෙන්කිරීම්වලින් රුපියල් මිලියන 41.17ක වටිනාකම වූ කොන්ත්‍රාත් 37ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ නමුත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3. වෙනත් නිරීක්ෂණ**

(අ) 2018 දෙසැම්බර් මස 31 වැනි දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 978ක් සහ තත්‍ය කාර්ය මණ්ඩලය 552ක් වීමෙන් පුරප්පාඩු 426ක් ව පැවතුණු අතර එම පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත 101 දෙනෙක් බඳවා ගෙන තිබුණි. අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු යටතේ ආචාර්යවරුන්ගේ පුරප්පාඩු 224ක් වූ අතර ඒ වෙනුවෙන් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගෙන තිබූ අතර 2018 වර්ෂය තුළ ඒ සඳහා රු. 36,872,411ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) 2018 දෙසැම්බර් මස 31 වැනි දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අනධ්‍යයන කාර්ය මණ්ඩලය 878ක් සහ තත්‍ය කාර්ය මණ්ඩලය 710ක් වීමෙන් පුරප්පාඩු 168ක් පැවතුණි. එම පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත 105 දෙනෙක් බඳවා ගෙන තිබුණ ද විශ්වවිද්‍යාලයේ අංශ 21ක තවදුරටත් කාර්මික නිලධාරී තනතුරුවල පුරප්පාඩු 44ක් පැවතුණි.

(ඇ) අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ ආචාර්යවරුන් 32 දෙනෙකුට අදාළ ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීම හේතුවෙන් 2018 දෙසැම්බර් මස 31 වන විට රු. 61,422,362ක මුදලක් අයවීමට තිබුණි. එම නිලධාරීන් 32 දෙනා අතරින් ගිවිසුම් හා බැඳුම්කර කඩකර තිබූ නිලධාරීන් 19ක ගෙන් අයවිය යුතු මුදල රු. 29,122,772ක් වුවද කිසිදු මුදලක් 2018 වර්ෂය තුළ අයකර ගැනීමට හැකි වී නොතිබුණි. එම ගිවිසුම් හා බැඳුම්කර කඩකල නිලධාරීන් අතරින් නිලධාරින් 08 දෙනෙකුගේ එකතුව රු. 20,808,390ක මුදලක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකරගැනීම සඳහා යොමුකර වසරකට වැඩි කාලයක් ගතවී තිබුණද එම අයකර ගැනීම

සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. එසේම ගිවිසුම් හා බැඳුම්කර කඩකර වසර 10ක් ඉක්මවූ නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 1,473,002ක මුදල අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) විදේශ අධ්‍යයන කටයුතු සඳහා ඇතිකර ගෙන තිබූ ගිවිසුම කඩකල ආචාර්යවරයෙකුගෙන් අයකර ගතයුතු රු. 4,093,176ක් ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා පැවරූ නඩුවක් සම්බන්ධයෙන්, ප්‍රධාන ගිවිසුම අත්සන් කිරීමට පෙර ඇප ගිවිසුම් අත්සන් කිරීම සහ ඉලක්කමින් ලියූ වටිනාකම සනාථ කිරීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වීම යන කරුණු හේතුවෙන් ඇපකරුවන් වගකීමට නොබැඳෙන බවත් අධිකරණ තීන්දුව මගින් ප්‍රකාශයට පත්කර නඩුව නිෂ්ප්‍රභා කර තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලයෙහි වගකිව යුතු නිලධාරීන් විසින් නොසැලකිලිමත්ව හා වගකීම් විරහිතව කටයුතු කිරීම හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ඇතිවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) 2018 වර්ෂයේ පර්යේෂණ සිදු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 60ක් ඇස්තමේන්තු කර තිබුණද ඒ සඳහා රු. 75.97 වැයකර තිබුණු අතර, ඇස්තමේන්තු කිරීමේදී රු. 15.97ක ප්‍රතිපාදන ඌනතාවයක් පැවතුණි.

පර්යේෂණවල නිරත වීමට අපේක්ෂිත දේශීය සිසුන් හා විදේශීය සිසුන් පිළිවෙලින් 400ක් හා 25ක් වුවද සත්‍ය වශයෙන් පර්යේෂණවල නිරත සංඛ්‍යාව දේශීය සිසුන් 108ක් හා විදේශීය සිසුන් එක් අයෙක් පමණක් විය.

2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පර්යේෂණ සඟරා ගණන 281ක් ද, සම්මේලන/සම්මන්ත්‍රණ පර්යේෂණ ගණන 765ක් දක්වා ද හා 2010 වර්ෂයේ සිට ලබාගත් පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව 30 දක්වා ද වර්ධනය කර ගැනීම ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂා කළ ද ඒ සඳහා ලඟාවී ඇති මට්ටම පිළිවෙලින් 26ක් 55ක් සහ 05ක් වශයෙන් අවම මට්ටමක විය.

(ඊ) ජාතික අවශ්‍යතාවය සහ කාර්මික ක්ෂේත්‍රයේ සහ සමාජයේ අභිමතාර්ථවලට ප්‍රතිචාර වශයෙන් අධ්‍යාපනය සපයන ප්‍රමුඛ විශ්වවිද්‍යාලයක් වීම වෙනුවෙන් 2018 වර්ෂයේ අපේක්ෂිත උපාධිධාරී රැකියා අනුපාතය 96ක් ලෙස අපේක්ෂා කර තිබුණ ද සත්‍ය වශයෙන් ලඟාකරගෙන තිබුණු අනුපාතය 90.5ක් විය.

(උ) විශ්වවිද්‍යාලයේ භෞතික පරිසරය ඉහළ නැංවීම වෙනුවෙන් ඉඩම් 03ක් අත්පත් කර ගැනීමටත් තවත් ඉඩමක් මිළදී ගැනීමටත් අපේක්ෂා කර තිබුණ ද 2018 වර්ෂයේදී ඒ සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඌ) විශිෂ්ඨතම උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස ජාත්‍යන්තර අනන්‍යතාවයන් ළඟාකර ගැනීමේ අරමුණින් විශ්වවිද්‍යාලය සිය මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීමේදී 2018 වර්ෂයේදී ලෝක ශ්‍රේණිගත කිරීම්වල Webometrics ranking 2018 දී අපේක්ෂිත මට්ටම 2200ක් වුව ද ළඟා කරගත් මට්ටම 2713ක් ලෙස ද QS Asia ranking මට්ටම 2018දී අපේක්ෂිත මට්ටම 250 වුවද ළඟාකරගත් මට්ටම 291-300ක් ලෙස ද පැවතුණි.

(එ) සියලුම දේශන ශාලා නවතම අධ්‍යාපන ක්‍රමවේදයන්ට අනුගත වන ආකාරයට නවීකරණය හා සංවර්ධනය කිරීම සහ එක් එක් දෙපාර්තමේන්තුවක අවම වශයෙන් එක් දේශන ශාලාවක් හෝ වැඩිදියුණු කිරීම අපේක්ෂා කලද ඒ සඳහා ක්‍රියාකර නොතිබුණි.

(ඒ) 2018 දෙසැම්බර් මස 31 වැනි දිනට විශ්වවිද්‍යාලයේ පාඨමාලා සංවර්ධන අරමුදල් 32ක එකතුව රු. 37,413,961ක් පැවතුණි. ඉන් අරමුදල් 18ක එකතුව රු. 5,223,341ක් සමාලෝචිත වර්ෂය තුළ අක්‍රීයව පැවති අතර එම අරමුදල් අතරින් අරමුදල් 06ක එකතුව ර. 3,718,781ක් වූ ශේෂයක් පූර්ව වර්ෂ 03ක සිට අඛණ්ඩව අක්‍රීයව පැවතිණි.

(ඔ) 2018 දෙසැම්බර් මස 31 වැනි දිනට ඇස්තමේන්තු සංවර්ධන අරමුදල් 60ක එකතුව රු. 107,049,885ක් පැවතුණි. ඉන් රු. 7,869,915ක් වූ අරමුදල් 17ක් සමාලෝචිත වර්ෂය තුළ අක්‍රීයව පැවති අතර ඉන් එකතුව රු. 5,663,137ක් වූ අරමුදල් 12ක් වර්ෂ 3ක් තිස්සේ අක්‍රීයව පැවතුණි.

(ඕ) 2018 දෙසැම්බර් 31 වැනි දිනට වටිනාකම රු. 25,679,531ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් ශේෂයක් පැවති අතර ඉන් එකතුව රු. 4,518,868ක් ශිෂ්‍යත්ව අරමුදල් 32කින් පසුගිය වර්ෂ 7කට වැඩි කාලයක සිට කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනමා නොතිබුණි.

(ඵ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම

(i) නව ආපනශාලා සංකීර්ණය සඳහා අවශ්‍ය පුටු හා මේස රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාවලියෙන් බැහැරව කුළී පදනම මත ලබාගෙන තිබීම සම්බන්ධයෙන් කල පරීක්ෂාවේදී 2017 ජනවාරි 04 දිනැති 431 සහ 453 පාලක සභා අනුමැතියෙන් සියලු දෙනා චෝදනාවලින් නිදහස් කර තිබුණි.

(ii) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉදිකිරීම සඳහා අවශය ඉඩම 2019 මැයි මස 15 වැනි දින වන විටත් මිළදී ගෙන නොතිබුණි.

(iii) විශ්වවිද්‍යාලය සහ කෝඩ්ජෙන් ඉන්ටර්නැෂනල් සමාගම සමග බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් ඇතිකර ගෙන ඇති ගිවිසුම පරීක්ෂාවට අනුව විශ්වවිද්‍යාලය විසින් බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් අනුමත කරගෙන ඇති ප්‍රතිපත්ති සංග්‍රහය පරිදි බුද්ධිමය දේපළ අයිතිවාසිකම් විශ්වවිද්‍යාලය විසින් රඳවා ගතයුතු වුවද ඊට අනුකූල නොවන ලෙස විශ්වවිද්‍යාලයට කිසිම මූල්‍ය ප්‍රතිලාභයක් නොමැතිව කෝඩ්ජෙන් ඉන්ටර්නැෂනල් සමාගම සමග ගිවිසුමකට එළඹ තිබුණි.

ඩබ්. පී. සී. වික්‍රමරත්න,
විගණකාධිපති.

**21. මූල්‍ය ගිණුම් 2018**

21.1 2018 දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | *සටහන* | *2018* | *2017* |
|---|---|---|---|
| | | *රු. ශත* | *රු. ශත* |
| **වත්කම්** | | | |
| *ජංගම නොවන වත්කම් :* | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 1 | 10,037,825,672 | 9,886,061,960 |
| ආයෝජන (දිගුකාලීන) | 2 | 699,089,162 | 481,461,273 |
| නොනිමි වැඩ | 3 | 577,215,357 | 1,044,503,641 |
| ප්‍රාග්ධන අයිතම සඳහා ආනයන අත්තිකාරම් | | 3,804,637 | 4,677,612 |
| | | **11,317,934,828** | **11,416,704,486** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 4 | 19,728,034 | 16,506,318 |
| කාර්ය මණ්ඩලය වෙත ණය සහ අත්තිකාරම් | 5 | 52,034,483 | 51,469,614 |
| ලැබිය යුතු | 6 | 65,096,698 | 114,840,394 |
| පෙර ගෙවීම් | | 4,310,110 | 4,434,640 |
| බැංකු මුදල් | 7 | 164,681,510 | 105,071,661 |
| අතැති මුදල් | 8 | 5,000 | 3,200 |
| | | 305,855,835 | 292,325,826 |
| **මුළු වත්කම්** | | **11.623,790,663** | **11,709,030,312** |

| | සටහන | 2018<br>රු. ශත | 2017<br>රු. ශත |
|---|---|---|---|
| **'වගකීම්** | | | |
| *ජංගම වගකීම් :* | | | |
| ගෙවිය යුතු තැන්පතු | 9 | 24,464,794 | 23,440,750 |
| පර්යේෂණ ප්‍රදාන | 10 | 90,069,623 | 85,411,290 |
| ගෙවිය යුතු මුදල් | 11 | 164,441,746 | 90,119,811 |
| උපචිත වියදම් | - | 97,105,081 | 82,885.947 |
| විලම්බිත ආදායම් | 12 | 558,508,281 | 495,050,514 |
| | | **934,589,525** | **776,908,312** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| **පාරිතෝෂික වෙන්කිරීම්** | | **347,764,965** | **268,440,505** |
| | | **347,764,965** | **268,440,505** |
| **මුළු වගකීම්** | | **1,282,354,490** | **1,045,348,817** |
| **ශුද්ධ වත්කම්** | | | |
| | | **10,341,436,172** | **10,663,681,495** |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන - වැය කළ | 13 | 3,949,650,980 | 4,035,103,569 |
| ප්‍රාග්ධන ප්‍රදාන - වැය නොකළ | 14 | 18,652,736 | - |
| උත්පාදිත අරමුදල් ප්‍රාග්ධනය | 15 | 55,435,546 | 55,487,293 |
| පරිත්‍යාග | 16 | 638,353,279 | 712,239,381 |
| | | **4,662,092,541** | **4,802,830,243** |
| **සංචිත** | | | |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 5,701,953,501 | 5,940,080,295 |
| ක්‍රීඩා සංවර්ධන සංචිතය | | 1,360,900 | 1,292,900 |
| පොදු සංචිතය | | (813,782,527) | (703,846,865) |
| | | **4,889,531,874** | **5,237,529,330** |
| **අරමුදල්** | | | |
| සීමාකළ අරමුදල් | 17 | 764,132,225 | 600,506,998 |
| පරිත්‍යාග අරමුදල | 18 | 25,679,532 | 22,814,924 |
| **මුළු ශුද්ධ වත්කම්/හිමිකම්** | | **10,341,436,172** | **10,663,681,496** |

පිටු 06 සිට 16 දක්වා දිස්වන සටහන් මූල්‍ය ප්‍රකාශවල අවශ්‍ය කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා පාලක සභාව වග කියයි.

පාලක සභාව වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලද්දේ.

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා, උපකුලපති,

මහාචාර්ය පී. කේ. එස්. මහානාම, නියෝජ්‍ය උපකුලපති.

වී. කුලසේකර, වැඩබලන ලේඛකාධිකාරි, ගිණුම්කරණ නිලධාරි.

එස්. කේ. රොඩ්‍රිගෝ, වැඩබලන මූල්‍යාධිකාරි. සහකාර ගිණුම්කරණ නිලධාරි.

**21.2 2018 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය**

| | *සටහන* | *2018* *රු. ශත* | *2017* *රු. ශත* |
|---|---|---|---|
| **ආදායම** | | | |
| රජයේ ප්‍රදාන | | 2,329,350,000 | 1,950,496,000 |
| ශිෂ්‍යාධාර | | 6,578,900 | 4,616,200 |
| මහපොළ | | 98,852,600 | 86,382,100 |
| ප්‍රදාන ශිෂ්‍යත්ව | | 91,500 | 79,000 |
| පිරිවැය ප්‍රතිසාධන ක්‍රියාකාරකම්වලින් ලැබීම් | 31 | 536,644,801 | 508,563,296 |
| ලද පොලී | 19 | 46.777,967 | 22,647,248 |
| ශිෂ්‍යයන්ගෙන් ආදායම් | 20 | 10,426,210 | 10,727,664 |
| වෙනත් ආදායම් | 21 | 14,668,322 | 16,410,999 |
| | | - | - |
| රජයේ ප්‍රදාන/උත්පාදිත සහ පරිත්‍යාගවල ක්‍රමක්ෂය (ප්‍රාග්ධන) | | 655,769,145 | 577,147,403 |
| **මුළු ආදායම** | | **3,699,159,445** | **3,182,069,910** |
| **වියදම්** | | | |
| පුද්ගල වේතන | 22 | (1,899,255,770) | (1,535,717,309) |
| ගමන් සහ යැපීම් වියදම් | 23 | (8,071,653) | (7,089,303) |
| සුභසාධන සේවා | 24 | (44,615,277) | (65,532,223) |
| වෙනත් මෙහෙයුම් වියදම් | 25 | (138,458,466) | (86,055,421) |
| ශිෂ්‍යයන් වෙත මූල්‍ය සහාය | 26 | (105,523,000) | (91,075,300) |
| **උප එකතුව** | | **(2,195,924,165)** | **(1,785,469,555)** |
| කොන්ත්‍රාත්තුමය සේවා | 27 | (250,119,036) | (259,824,981) |
| සැපයුම් සහ පාරිභෝජන | 28 | (114,238,917) | (100,017,702) |
| අධ්‍යයන පර්යේෂණ | | (75,967,611) | (67,745,217) |
| නඩත්තු | 29 | (49,273,237) | (36,153,399) |
| පිරිවැය ප්‍රතිසාධන ක්‍රියාකාරකම් මත වියදම | 31 | (536,644,801) | (508,563,296) |
| ක්ෂය | | (574,861,957) | (480,268,352) |
| අනෙකුත් ප්‍රාග්ධන ක්‍රියාකාරකම් ක්‍රමක්ෂය | | - | (2,092,811) |
| මූල්‍ය පිරිවැය | 30 | (801,293) | (617,208) |
| **උප එකතුව** | | **(1,601,906,850)** | **(1,455,282,966)** |
| **මුළු වියදම** | | **(3,797,831,016)** | **(3,240,752,520)** |
| **කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/(හිඟය)** | | **(98,671,571)** | **(58,682,610)** |

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා, උපකුලපති, ගිණුම්කරණ නිලධාරී.

මහාචාර්ය පී. කේ. එස්. මහානාම, නියෝජ්‍ය උපකුලපති.

වි. කුලසේකර, ලේඛකාධිකාරී, සහකාර ගිණුම්කරණ නිලධාරී.

එස්. කේ. රොඩ්‍රිගෝ, වැඩබලන මූල්‍යාධිකාරී.

**21.4 2018 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | *සටහන* | *2018* *රු. ශත* | *2017* *රු. ශත* |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් අතිරික්තය (හිඟය) | | (98,775,297) | (58,682,610) |
| පිරිවැය ප්‍රතිසාධන ක්‍රියාමාර්ගවල හිඟයෙහි අඩුවීම | | - | - |
| | | **(98,775,297)** | **(58,682,610)** |
| **ගැළපුම්** | | | |
| බැර ගැළපුම (ලැයිස්. 9 + 10) | | 27,458,194 | 32,225,630 |
| හර ගැළපුම (ලැයිස්. 11 + 12) | | (38,722,286) | (7,266,348) |
| ක්‍රීඩා ක්‍රියාකාරකම් | | 65,000 | 66,500 |
| ලද පොළී | 19 | (46,777,967) | (27,647,248) |
| ප්‍රාග්ධන වැය නොකළ ගිණුම සඳහා ගැළපුම් | | - | (50,000,000) |
| කෙරෙමින් පවතින වැඩ ගිණුම සඳහා ගැළපුම් | | 1,005,799 | - |
| පාරිතෝෂික ගෙවීම් | | (20,261,407) | (26,794,952) |
| පැරණි ව්‍යායාම ශාලා ශේෂය ලියා හැරීම | | - | - |
| වත්කම් බැහැර කිරීමේ ලාභ/අලාභ | | - | 707,918 |
| බැංකු ගාස්තු | 30 | 801,293 | 617,208 |
| | | **(76,431,374)** | **(78,091,291)** |
| **මුදල් නොවන චලන** | | | |
| ක්ෂය | 1 | 574,861,957 | 480,268,352 |
| අනෙකුත් ප්‍රාග්ධන වියදම්වල ක්‍රමක්ෂය | 13 | 75,967,611 | 69,793,028 |
| පාරිතෝෂික වෙන් කිරීම් | | 99,585,866 | 46,450,362 |
| රජයේ ප්‍රදාන/උත්පාදිත සහ පරිත්‍යාගවල ක්‍රමක්ෂය (ප්‍රාග්ධන) | 13/15/16 | (655,665,419) | (577,147,403) |
| | | **94,750,015** | **19,364,339** |
| **සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ අතිරික්තය/(හිඟය)** | | **(80,456,656)** | **(117,409,563)** |
| **කාරක ප්‍රාග්ධනයේ වැඩිවීම/අඩුවීම** | | | |
| තොගවල වැඩිවීම/අඩුවීම | 4 | (3,.221,716) | 3,945,095 |
| වෙනත් වත්කම්වල වැඩිවීම/අඩුවීම | | 49,303,357 | (10,417,015) |
| ජංගම වගකීම්වල වැඩිවීම/අඩුවීම | | 157,681,214 | 103,178,540 |
| ආනයන අත්තිකාරම් වැඩිවීම/අඩුවීම | | 872,975 | 52,432,899 |
| කෙරෙමින් පවතින වැඩවල වැඩිවීම/අඩුවීම | | (72,813,722) | 3.266,807 |
| ණය පොළී සහ කාර්ය මණ්ඩල අත්තිකාරම් | 19 | 2,207,876 | 3,290,224 |
| | | 134,029,933 | 155,696,551 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | 53,573,277 | 38,286,988 |

| | සටහන | 2016<br>රු. ශත | 2015<br>රු. ශත |
|---|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | |
| පිරියත සහ උපකරණ මිළදී ගැනීම (රජයේ ප්‍රදාන) | 1 | (276,948,586) | (542,938,919) |
| පිරියත සහ උපකරණ මිළදී ගැනීම (උත්පාදිත අරමුදල්) | 1 | (4,728,783) | (8,900,699) |
| පිරියත සහ උපකරණ මිළදී ගැනීම (පරිත්‍යාග) | 1 | (8,224,273) | (668,647,229) |
| වෙනත් ප්‍රාග්ධන වියදම් සඳහා ගෙවීම් | 13 | (75,967,611) | (69,793,028) |
| නව ආයෝජන | 2 | (115,000,000) | (110,000,000) |
| ආයෝජනවලින් පොළී (දිගුකාලීන) | 2 | (32,752,762) | (12,242,513) |
| ආයෝජනවලට ගැලපුම් | | (69,875,127) | |
| පැරණි තොග අලෙවියෙන් ලාභ | | - | - |
| පරිත්‍යාග අරමුදල සඳහා ලද බැංකු පොළී | 18 | 5,287,014 | 1,446,499 |
| ආයෝජනවලින් පොළිය | 19 | 44,570,091 | 24,357,024 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ** | | (533,640,035) | (1,386,718,865) |
| **මුල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | |
| භාණ්ඩාගාරයෙන් ප්‍රදාන | | 552,000,000 | 725,000,000 |
| උපකරණ සඳහා UGC ප්‍රදානය | | - | - |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් ප්‍රදාන | | 25,000,000 | 20,000,000 |
| දේපළ පිරියත සහ උපකරණ මිළදී ගැනීමට උත්පාදිත ආදායමෙන් අරමුදල් | | 4,728,783 | 8,900,699 |
| දේපළ, පිරියත සහ උපකරණ සඳහා ප්‍රදාන | 16 | 8,224,273 | 668,647,229 |
| වෙනත් ශුද්ධ ලැබීම් | | 6,951,712 | 232,697 |
| පරිත්‍යාග අරමුදල වෙතින් තිළිණ ගෙවීම් | 18 | (2,422,407) | (3,121,724) |
| පරිත්‍යාග අරමුදලට ප්‍රේෂණ | 18 | - | 2,730,000 |
| සීමා කළ අරමුදල ප්‍රේෂණ | 17 | 486,972,934 | 514,529,031 |
| සීමා කළ අරමුදලෙන් ගෙවීම් | 17 | (323,347,708) | (521,639,354) |
| ගෙවූ බැංකු ගාස්තු | 30 | (801,293) | (617,208) |
| මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ | | **757,306,296** | **1,414,661,369** |
| මුදල් සහ මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | 277,239,537 | 66,229,492 |
| පෙර වසරේ මුදල් සහ මුදල් සමාන දෑවල ශේෂය ඌන ප්‍රකාශය | | - | - |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 32 | 586,536,134 | 520,306,642 |
| කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 32 | **863,775,671** | **586,536,134** |

10 - 882

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 2258805.
ගුරුදෙනියේ ගෙදර ප්‍රේමලාල් ගුරුදෙනිය.

2019 ඔක්තෝබර් මස 25 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය රැස්වීමේදී විශේෂිතව සහ ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. බී. සිරිවර්ධන විසින් සහතික කරන ලද 2018.05.18 වැනි දින අංක 5998 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමින් ලියන ලද්දාවූ බැඳුම්කරය යටතේ ගුරුදෙනියේ ගෙදර පද්මලාල් ගුරුදෙනිය යන අය බන්ධනදායී වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අසූතුන් ලක්ෂ තුන්සිය පනස් හතරයි ශත එකක (රු. 8,300,354.01) මුදලක් 2019.08.29 වැනි දින විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් අසූතුන් ලක්ෂ තුන්සිය පනස් හතරයි ශත එකක (රු. 8,300,354.01) මුදල ද 2019.08.30 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 7,293,186.70) මුදලක් සඳහා වාර්ෂිකව 13.5% බැගින් වූ වැඩිපුර පොලිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 5998 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රයන් මහනුවර, මාවිල්මඩ, ලේවැල්ල පාර, දුටුගැමුණු මාවතේ, අංක 369/1හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් සම්මත කරගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාත කඳුකර පහළ කෝරළේ, මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, මහනුවර ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 267, හිඳගල ග්‍රාම නිලධාරි වසම හි හිඳගල පායින්ගමුව ගමේ පිහිටි "ගොඩමුන්න වත්ත" නමැති ඉඩමට බලයලත් මානක යූ. ආර්. රත්නායක විසින් 1983.09.21 සහ 28 වැනි දින මැන සාදන ලද අංක 1105 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කළ ලොට් 01ජී නමැති ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට : ලොට් 01ඊ, නැගෙනහිරට : ප්‍රධාන පාර ද, දකුණට : ලොට් අංක 2 සහ 3 ද, බස්නාහිරට : ලොට් 01 ඊ සහ 01 එෆ් යන මෙකී මායිම් තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් දහහතයි දශම අටයි නවයක් (අ.0, රූ.0, පර්. 17.89) විශාල ඉඩම් මෙය මහනුවර ඉඩම් කාර්යාලයේ වෙළුම්/පත්‍ඉරුව ඒ 618/01 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ලොට් 1 ජී දරන ඉඩම මෑතකදී කරන ලද මැනුමකට අනුව පහත පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාත කඳුකර පහළ කෝරළේ, මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, මහනුවර ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ අංක 267, හිඳගල ග්‍රාම නිලධාරි වසම හි හිඳගල පායින්ගමුව ගමේ පිහිටි "ගොඩමුන්න වත්ත" නමැති ඉඩමට බලයලත් මානක පී. ඉන්ද්‍රානි මල්ලිකා විසින් 2017.11.11 වැනි දින මැන සාදන ලද අංක 4068 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කළ ලොට් 01ජී නැමති ඉඩම් කොටසට මායිම් එනම්, උතුරු නැගෙනහිරට : මහනුවර දොළුව ප්‍රධාන පාර ද, දකුණු නැගෙනහිරට : මල ඇල වෙන කරන බලයලත් මානක මීසෝ සහ මීසෝ විසින් සාදන ලද අංක 2134 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 සහ 3න් ද, දකුණු බටහිරට : බලයලත් මානක යූ. ආර්. රත්නායක විසින් සාදන ලද අංක 1105 පිඹුරේ සඳහන් ලොට් 1 ඊ සහ ලොට් 1 එෆ් ද, උතුරු බස්නාහිරට : බලයලත් මානක යූ. ආර්. රත්නායක විසින් සාදන ලද අංක 1105 පිඹුරේ සඳහන් ලොට් 01ඊ යන මෙකී මායිම් තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් දහහතයි (අ. 0, රූ. 0, පර්. 17.00) හෝ හෙක්ටයාර් 0.0428 විශාල ඉඩම්.

ආර්. ඒ. පී. රාජපක්‍ෂ,
සමාගම් ලේකම්.

2019 නොවැම්බර් මස 07 වැනි දින.

10 - 907

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 2294061.
B V හෝම් බිල්ඩර්ස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට් ලිමිටඩ්).

2019 ඔක්තෝබර් මස 25 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී පී. හේරත් විසින් 2017 අප්‍රේල් මස 25 වැනි දින අංක 3231 සහ 2017 ඔක්තෝබර් මස 30 වැනි දින සහතික කරන ලද අංක 3394 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශ්‍රී ලංකාවේ නීති යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන නුගේගොඩ, චැපල් පටුමගේ, අංක 37/6 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති BV හෝම් බිල්ඩර්ස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ සඳුන් සාගර අබේගුණවර්ධන උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ

රුපියල් මිලියන එකොළහයි එක් ලක්ෂ විසි හය දහස් පන්සිය විසි පහයි ශත පනස් පහක (රු. 11,126,525.55) මුදලක් 2019 සැප්තැම්බර් මස 27 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට දුන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන එකොළහයි එක් ලක්ෂ විසි හය දහස් පන්සිය විසි පහයි ශත පනස් පහක (රු. 11,126,525.55) මුදල අයකර ගැනීම සඳහා සහ 2019 සැප්තැම්බර් මස 28 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 9,700,000 මුදලක් මත 17.00% වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් හා වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 3231 සහ 3394 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තාවූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකාර එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ මහනගර සභා සීමා ඇතුළත ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පාගොඩ, චැපල් පටුමගේ, 519සී ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත ගංගොඩවිල ගමේ පිහිටි "හෙදවකගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. සිල්වා විසින් 2011.04.10 වැනි දින පිළියෙල කරන ලද අංක 4340 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : චැපල් පටුමගේ, උපනන්ද බටුගෙදර මාවතේ, වරිපනම් අංක 37/6 දරන පරිශ්‍රය මගින් ද. නැගෙනහිරට : චැපල් පටුමගේ, වරිපනම් අංක 37/5 දරන පරිශ්‍රය මගින් ද, දකුණට : අඩි 13 පළල පාර සහ චැපල් පටුමගේ, වරිපනම් අංක 33/4 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : අංක 640 දරන පිඹුරේ ලොට් B1 මගින් ද මායිම් වූ එකී අංක 4340 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හතක (අ.0, රූ.0, පර්. 7) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව M 26/59 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ලොට් 1 පහත දක්වෙන ඉඩෙමෙන් නැවත මැනීමක් වේ.

ඉහත කී ගංගොඩවිල ගමේ පිහිටි "හෙදවකගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. ජී. පියසේන විසින් 2002.04.12 වැනි දින පිළියෙල කරන ලද අංක 977 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : චැපල් පටුමගේ, වරිපනම් අංක 37/6 දරන පරිශ්‍රය මගින් ද, නැගෙනහිරට : චැපල් පටුමගේ, වරිපනම් අංක 37/5 සහ 37/5A දරන පරිශ්‍ර මගින් ද, දකුණට : පාර සහ චැපල් පටුමගේ, වරිපනම් අංක 33/4 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : අංක 640 දරන පිඹුරේ ලොට් B1 මගින් ද මායිම් වූ එකී අංක 977 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හතක (අ.0, රූ.0, පර්. 7) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A 378/01 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්‍ෂ,
සමාගම් ලේකම්.

2019 නොවැම්බර් මස 07 වැනි දින.

10 - 867

---

### නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2020 ජුනි මස 23 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරගන්නා ලදී.

ප්‍රසිද්ධ නොතාරිස් පී. බී. සී. සමරසේන විසින් සහතික කරන ලද අංක 16 සහ 2016.07.04 වැනි දින දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් අනුරුද්ධික ද සේරම් විසින් සහතික කරන ලද අංක 502 සහ 2017.06.05 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින්, ඉහත කී නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (එකී බැංකුව) නමින් උකස් කොට ඇපයට තබන ලද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වෙන දේපළ සහ පරිශ්‍රය, එලෙස ඇපයට තැබීම මත ප්‍රදානය කරන ලද ණය මුදල්/ණය පහසුකම් ගෙවා පියවා දැමීම, කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක 199 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන, ලියාපදිංචි අංක PV 68152 දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන ඩිමැක් මැනුෆැක්චරින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සහ කොළඹ 02, වොක්ෂෝල් වීදියේ. අංක 199 දරන ස්ථානයේ ලිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන, ලියාපදිංචි අංක PV 80856 දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථාපරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන ඩිමැක් සේල්ස් ඇන්ඩ් සර්විසර්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සහ කොළඹ 02, වොක්ෂෝල්

වීදියේ අංක 199 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන. ලියාපදිංචි අංක PV 14438 දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන ඒසියාටික් ප්‍රොපර්ටි ඩිවලපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම (ණය ගැණුම්කරුවන්) විසින් පැහැර හැරීම කර ඇති බැවින් ද,

මෙහි පහත සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රයේ සින්නක්කර අයිතිකරු වන එකී ඒසියාටික් ප්‍රොපර්ටි ඩිවලපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් සිය සින්නක්කර අයිතිය, හිමිකම සහ භුක්තිය ඉහත කී අංක 16 සහ 502 දරන උකස් බැඳුම්කර යටතේ එකී බැංකුව වෙත උකසට තබා ඇති බැවින් ද,

ඒ අනුව, ඉහත කී අංක 16 සහ 502 දරන බැඳුම්කර මත 2020.05.31 වැනි දිනට රුපියල් විසි නව කෝටි හාර ලක්ෂ අනූපන් දහස් අටසිය අටකුත් ශත විස්සක (රු. 290,495,808.20) මුදලක් එකී බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන බැවින් ද,

එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය, සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (එකී මුල් පනත) යටතේ එකී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියාකරමින්, රුපියල් විසි නව කෝටි හාර ලක්ෂ අනූපන් දහස් අටසිය අටකුත් ශත විස්සක (රු. 290,495,808.20) මුදල හෝ එකී දේපල විකිණීමේ දිනය වන විට එයින් නොගෙවා ඉතිරිව තිබෙන යම් මුදලක් සහ ඊට අමතරව.

(i) ඉහත කී අංක 16 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් විසි හතර කෝටි හාර ලක්ෂයක (රු. 240,400,00.00) මුදල මත වර්ෂයකට සියයට දහනවයයි දශම අටයි පහ (19.85%) බැගින් ද,

(ii) ඉහත කී අංක 16 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් අනූහය ලක්ෂ හැත්තෑ අට දහස් නවසිය හැත්තෑ තුනකුත් ශත හතළිස් හතරක (රු. 9,678,973.44) මුදල මත වර්ෂයකට සියයට දාහතයි දශම පහක (17.5%) බැගින් ද,

(iii) ඉහත කී අංක 502 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් දෙකෝටි විසිලක්ෂ තිස් දෙදහස් හත්සිය අනූ තුනකුත් ශත පනස් දෙකක (රු. 22,032,793.52) මුදල මත වර්ෂයකට සියයට තිහක (30%) බැගින් ද.

වන පරිදි 2020 ජුනි මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය තෙක් පොලිය සහ තව ද, ප්‍රචාරණ වියදම් සහ දේපළ විකිණීමේ පිරිවැය සහ මුල් පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව දරන ලද වෙනත් ගාස්තු යනාදිය සහ තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වේතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා එකී ණය මුදල්/ණය පහසුකම් සඳහා ඉහත කී බැඳුම්කර මගින් ඇපයක් වශයෙන් එකී බැංකුවට උකසට තබන ලද මෙහි පහත සවිස්තරව දැක්වෙන දේපළ සහ පරිශ්‍රයේ සින්නක්කර සහ වෙනත් අයිතිවාසිකම්, හිමිකම් හා භුක්තිය ඇතුළුව එකී දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන එල්. බී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හුණුපිටිය ග්‍රාම සේවා වසමේ, හුණුපිටියේ, අංක 23 දරන නාගරික කොට්ඨාසයේ, කොම්පඤ්ඤ වීදියේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 010159 සහ 2010.08.26 සහ 2010.08.31 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් B වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටසට මායිම්, උතුරට : බේරේ වැව ද. නැගෙනහිරටඃ වොක්ෂෝල් වීදියේ, වරිපනම් අංක 217/1 දරන පරිශ්‍රය ද, දකුණට : වොක්ෂෝල් වීදිය ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ඩී. ඩී. සී. හීන්දෙණිය විසින් මැන සාදන ලද අංක 214A දරන පිඹුරේ නිරූපිත ලොට් A ද, යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 010159 දරන පිඹුර අනුව රූඩ් එකකුත් පර්චස් බින්දුවයි තුනයි දශම අටයි හතක් (අ. 0, රූ. 1, පර්. 03.87) විශාල ඉඩම් කැබැල්ල, වොක්ෂෝල් වීදියේ, වරිපනම් අංක 199 සහ 205 දරන ස්ථිර ගොඩනැගිලි සහ එකී බිම් කොටස තුළ පිහිටි ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමගය.

ඉහත කී ලොට් B වනාහි මෙහි පහත සවිස්තරව දැක්වෙන ඉඩමේ නැවත මැන බෙදීමක් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හුණුපිටිය ග්‍රාම සේවා වසමේ, හුණුපිටියේ, අංක 23 දරන නාගරික කොට්ඨාසයේ, කොම්පඤ්ඤ වීදියේ පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. ඩී. සී. හීන්දෙණිය විසින් මැන සාදන ලද අංක 214A සහ 1988.11.08 වැනි දින සහ 1989.11.29 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් B වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්ක කළ බිම් කොටසට මායිම්, උතුරට : බේරේ වැව ද. නැගෙනහිරට : වොක්ෂෝල් වීදියේ වරිපනම් අංක 217/1 දරන පරිශ්‍රය ද, දකුණට : වොක්ෂෝල් වීදිය ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ඩී. ඩී. සී. හීන්දෙණිය විසින් මැන සාදන ලද අංක 214A දරන පිඹුරේ නිරූපිත ලොට් A ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකකුත් පර්චස් බිංදුවයි තුනයි දශම අටයි හතක් (අ. 0, රූ. 1, පර්. 03.87) විශාල ඉඩම් කැබැල්ල, වොක්ෂෝල් වීදියේ, වරිපනම් අංක 199 සහ 205 දරන ස්ථිර ගොඩනැගිලි සහ එකී බිම් කොටස තුළ පිහිටි ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් සමග වන අතර, මෙම දේපළ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 51/123 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, මෙහි ඉහත සවිස්තරව දැක්වෙන ඉඩම් කැබැල්ලේ වර්තමානයේ තිබෙන හෝ මෙහි මින් මතු කලින් කලට සවිකරන හෝ ස්ථිරවම ඇදනු ලබන සියලු සහ සෑම නිශ්චල පිරියත සහ යන්ත්‍රසූත්‍ර, උපකරණ, තිරවුරු, සවිකිරීම් සහ සේවාවන් සහ එමෙන්ම උපකරණ, විදුලි සැපයුම් පද්ධති උපකරණ, ජල සැපයුම් පද්ධති උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායුසමීකරණ උපකරණ ද සමගය .

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

10 - 747

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. ආර්. පී. චන්ද්‍රපෙරුමාරච්චි.
ගිණුම් අංක : 0148 5000 7218.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.11.28 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. එස් කුලසිංහ යන අය විසින් ලියා සහතික කරන ලද 2018 මැයි මස 25 සහ 28 දාතම හා අංක 129 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මංජුල රොෂාන් පෙරේරා චන්ද්‍රපෙරුමාරච්චි යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 129 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල ශ්‍රී ලංකා මුදලින් රුපියල් එක්කෝටි හතළිස් හතර ලක්ෂ හැත්තෑ පන් දහස් පන්සිය අනූ හතරයි ශත අසූ තුනක (රු. 14,475,594.83) මුදලක් 2019 නොවැම්බර් මස 13 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්කෝටි හතළිස් හතර ලක්ෂ හැත්තෑ පන් දහස් පන්සිය අනූ හතරයි ශත අසූ තුනක (රු. 14,475,594.83) මුදල ද, 2019 නොවැම්බර් මස 14 වැනි දින සිට අංක 129 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි තිස් පන් ලක්ෂ අනූ හතර දහස් විසි තුනයි ශත හැටක (රු. 13,594,023.60) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක (16.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 129 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, ගල්ඒදණ්ඩ, අංක 265A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගල් ඒදණ්ඩ ග්‍රාමයේ පිහිටි ගල්ඒදණ්ඩ පාර, වරිපනම් අංක 145A දරන "හල්ගහවත්ත සහ මීගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ඒ. කටුගම්පොල යන අය විසින් සාදන ලද 2001 අප්‍රේල් 11 දාතම හා අංක 50/2001 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් B1X වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ගල් ඒදණ්ඩ පාර, නැගෙනහිරට : ලොට් B1Y, දකුණට : අංක 8863 දරන පිඹුරේ ලොට් B2 සහ බස්නාහිරට : අංක 647 දරන පිඹුරේ ලොට් A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් පහක් (A:0, R:0, P:35) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 50/2001 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව N 501/32 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10 - 947

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ඩී. ඩබ්ලිව්. සී. පී. කේ. ද සිල්වා සහ කේ. ඩී. ආර්. මාග්‍රට්.
ගිණුම් අංක : 0065 5000 0480

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2020.09.24 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එම්. නාගොඩවිතාන යන අය විසින් ලියා සහතික කරන ලද 2013 නොවැම්බර් මස 22 දාතම හා අංක 253 දරන සහ

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඩී. එම්. විතානගේ යන අය විසින් ලියා සහතික කරන ලද 2016 දෙසැම්බර් මස 16 දාතම හා අංක 933 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කාලිංග දොන් රූපචන්ද්‍ර මාග්‍රට් සහ දිනයාදුර විමල්චන්ද්‍ර පුෂ්ප කුමාර ද සිල්වා යන අය බන්ධනදායීන් වශයෙන් හා කාලිංග දොන් රූපචන්ද්‍ර මාග්‍රට් යන අය උකස්කරු වශයෙන් ද, පැහැර ඇති හෙයින් ද, එකී අංක 253 සහ 933 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පනස් අට ලක්ෂ අසූ එක් දහස් නමසිය හැට දෙකයි ශත පනස් දෙකක (රු. 5,881,962.52) මුදලක් 2020 සැප්තැම්බර් මස 08 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පනස් අට ලක්ෂ අසූ එක් දහස් නමසිය හැට දෙකයි ශත පනස් දෙකක (රු. 5,881,962.52) මුදල ද, 2020 සැප්තැම්බර් මස 09 වැනි දින සිට අංක 253 සහ 933 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් ලක්ෂයක (රු. 5,000,000) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Four Decimal Fiver per centum (4.5%) per annum (floor rate of 16.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 253 සහ 933 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මීනුවන්ගොඩ උතුර අංක 125/2 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ මැදමුල්ල ග්‍රාමයේ පිහිටි දිවුලපිටිය පාර, වරිපනම් අංක 122 දරන "කොස්ගහවත්ත සහ කොස්ගහවතුකැබැල්ල" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඩී. එන්. සිරිරත්න යන අය විසින් සාදන ලද 2013 ඔක්තෝබර් මස 19 දාතම හා අංක 9208 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මීනුවන්ගොඩ දිවුලපිටිය ප්‍රධාන පාර (දිවුලපිටිය පාර) සහ දිවුලපිටිය පාර, වරිපනම් අංක 122A දරන නිලන්ත රොෂාන් විසින් හිමිකම් කියන ඉඩම නැගෙනහිරට : දිවුලපිටිය පාර, වරිපනම් අංක 124/34A දරන ඒ. ඒ. රංජනී විසින් හිමිකම් කියන ඉඩම, දකුණට : දිවුලපිටිය පාර, වරිපනම් අංක 124/34A දරන ඒ. ඒ. රංජනී විසින් හිමිකම් කියන ඉඩම සහ වසන්ත යාපා කේ. ස්වර්ණලතා ඩයස්, එස්. එච්. ඒ. සී. පී. සෙනරත් විසින් හිමිකම් කියන ඉඩම, බස්නාහිරට : දිවුලපිටිය පාර, වරිපනම් අංක 120A දරන වසන්ත යාපා කේ. ස්වර්ණලතා ඩයස් එස්. එච්. ඒ. සී. පී. සෙනරත් විසින් හිමිකම් කියන ඉඩම සහ මීනුවන්ගොඩ පාර (දිවුලපිටිය පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් නමයයි දශම දෙකයි අටක් (A:0, R:0, P:39.28) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 9208 දරන එකී පිඹුරට අනුව ය.

අංක 9208 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 1 වෙනත් අයුරකින් පහතින් විස්තර කොට ඇති මෙම ඉඩමේ නැවත මිනුමක් ද වන අංක 1027 දරන පිඹුරේ ලොට් 4හි නැවත මිනුමකි :

එකී මැදමුල්ල ග්‍රාමයේ පිහිටි දිවුලපිටිය පාර, වරිපනම් අංක 122 දරන "කොස්ගහවත්ත සහ කොස්ගහවතුකැබැල්ල" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඒ. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1975 අගෝස්තු 22 දාතම හා අංක 1917A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට සහ නැගෙනහිරට : ඩී. එෆ්. ජයසේකර විසින් හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : වයි. ඩී. බුද්ධදාස විසින් හිමිකම් කියන ඉඩම සහ නිලමේ විසින් හිමිකම් කියන ඉඩම, බස්නාහිරට : නිලමේ විසින් හිමිකම් කියන ඉඩම, වයඹට : මීනුවන්ගොඩ දිවුලපිටිය පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (A:0, R:1, P:0) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1917A දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව K 115/80 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10 - 946

---

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

රිලයන්ස් ඔටෝ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0212 1000 4006.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2020.09.24 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඩී. එම්. විතානගේ යන අය විසින් ලියා සහතික කරන ලද 2018 අගෝස්තු 31 දාතම හා අංක 2653 දරන සහ 2019 දෙසැම්බර් මස 18 දාතම හා අංක 4006 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනවල මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 00200083 දරන ශ්‍රී ලංකා සමාගම් නීතීන් යටතේ නිසිලෙස සංස්ථාගත කොට ඇති සමාගමක් වන රිලයන්ස් ඔටෝ ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් හා සිරිදේව චන්දිම නොහොත් චන්දිම සිරිදේව යන අය උකස්කරු වශයෙන්ද පැහැර ඇති හෙයින් ද, එකී අංක 2653 සහ 4006 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැට හත් ලක්ෂ අනූ හය දහස් හයසිය පනස් එකයි ශත පහක (රු. 6,796,651.05) මුදලක් 2020 සැප්තැම්බර් මස 08 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හැට හත් ලක්ෂ අනූ හය දහස් හයසිය පනස් එකයි ශත පහක (රු. 6,796,651.05) මුදලක්, 2020 සැප්තැම්බර් මස 09 වැනි දින සිට අංක 2653 සහ 4006 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැට දෙලක්ෂ පනස් හය දහස් හාරසිය පනස් හතයි ශත තිස් පහක (රු. 6,256,457.35) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 2653 සහ 4006 දරන එකී උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන්වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ බටපොත්ත අංක 479E දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ තලංගම දකුණ පිහිටි රොබට් ගුණවර්ධන මාවත, වරිපනම් අංක 245/B 30 දරන "තල්ගහවත්ත (වෙළුම පත්‍රිරුව B 474/104 හි දෙල්ගහවත්ත වශයෙන් සාවද්‍ය ලෙස ලියනු ලැබ ඇති)" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. එන්. ඒ. අල්විස් යන අය විසින් සාදන ලද 2012 අගෝස්තු මස 11 දාතම හා අංක 4474 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1C2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මහ නගර සභා පාර සහ අංක 3999 දරන පිඹුරේ ලොට් 1C1, නැගෙනහිරට : අංක 3999 දරන පිඹුරේ ලොට් 1C1 සහ අංක 1727 දරන පිඹුරේ ලොට් 9, දකුණට : අංක 1727 දරන පිඹුරේ ලොට් 9 සහ ඩී. පෙරේරා විසින් හිමිකම් කියන ඉඩම, බස්නාහිරට : ඩී. පෙරේරා විසින් හිමිකම් කියන ඉඩම සහ මහ නගර සභා පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවයි දශම අටයි බිංදුවක් (A:0, R:0, P:15.80) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4474 දරන පිඹුරට අනුව ය.

අංක 4474 දරන පිඹුරේ ලොට් 1C2 වෙනත් අයුරකින් පහත සඳහන් ඉඩමේ නැවත මිනුමක් වන බලයලත් මානක තැන එස්. ඩී. ලියනසූරිය යන අය විසින් සාදන ලද 1995 ඔක්තෝබර් මස 30 දාතම හා අංක 6321 දරන පිඹුරේ ලොට් 1C2හි නැවත මිනුමකි :

එකී තලගංම දකුණ පිහිටි රොබට් ගුණවර්ධන මාවත, වරිපනම් අංක 245/B 30 දරන "තල්ගහවත්ත (වෙළුම පත්‍රිරුව B 474/104 හි දෙල්ගහවත්ත වශයෙන් සාවද්‍ය ලෙස ලියනු ලැබ ඇති)" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. ඩී. සිරිසේන යන අය විසින් සාදන ලද 1981 ජනවාරි 14 දාතම හා අංක 3999 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 1C2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට : ලොට් 1C3 සහ ලොට් 1C2, ගිණිකොනට : අංක 1727 දරන පිඹුරේ ලොට් 9, නිරිතට : ඩී. පෙරේරා විසින් හිමිකම් කියන ඉඩම, වයඹට : දූන් එල් පොඩිසිංඤෝ පෙරේරා සහ වෙනත් අයගේ වත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ හතයි දශම අටයි බිංදුවක් (A:0, R:0, P:17.80) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 3999 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 1431/05 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10 - 945

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එම්. ආර්. පී. චන්ද්‍රපෙරුමාරච්චි.
ගිණුම් අංකය : 0148 5000 7218.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2019.11.28 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඩී. එම්. විතානගේ යන අය විසින් ලියා සහතික කරන ලද 2018 සැප්තැම්බර් මස 21 සහ 27 දාතම හා අංක 2736 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මංජුල රොෂාන් පෙරේරා චන්ද්‍රපෙරුමාරච්චි යන අය බන්ධනදායී වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක 2736 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් තුන්කෝටි හැට එක් ලක්ෂ අසූ හත් දහස් නමසිය විස්සයි ශත පනස් නමයක (රු. 36,187,920.59) මුදලක් 2019 නොවැම්බර් මස 13 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තුන්කෝටි හැටඑක් ලක්ෂ අසූහත් දහස් නමසිය විස්සයි ශත පනස් නමයක (රු. 36,187,920.59) මුදල ද, 2019 නොවැම්බර් මස 14 වැනි දින සිට අංක 2736 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් තුන්කෝටි පනස් දෙලක්ෂ විසිහය දහස් හත්සිය තිස් හයයි ශත අසූ හයක (රු. 35,226,736.86) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනක් (13%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 2736 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනිමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරී පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ මහර කඩවත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ වේරගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ නුන්ගොමුගොඩ ග්‍රාමයේ පිහිටි පාසිහේන පාර වරිපනම් අංක 10 සහ 12 දරන ''දියපරගහවත්ත, ඇටඹගහවත්ත, හකුරුගේමුන්දෙණිය නොහොත් දෙල්ගහලන්ද, මිල්ලගහවත්ත සහ මාකේවිටගේ ක්‍රිස්ටියන් පෙරේරා විදානරාලගේවත්ත නොහොත් නැදුන්ගහවත්ත '' යයි කියනු ලබන ඉඩම බලයලත් මානක තැන එම්. එච්. ඒ. නිල්මිණී යන අය විසින් සාදන ලද 2018 මාර්තු මස 12 දාතම හා අංක 78/2018 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාසිහේන පාර, නැගෙනහිරට : ඩී. සී. පී. රාජසේකරගේ ඉඩම, දකුණට : දැනට පවත්නා මාර්ගය (අත්හැර දමන ලද) සහ බස්නාහිරට : ජයවර්ධනගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් අටයි දශම හතයි අටක් (අ. 0, රූ. 0, පර්. 38.78) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 78/2018 දරන එකී පිඹුරට අනුව ය.

එකී ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී නුන්ගොමුගොඩ ග්‍රාමයේ පිහිටි ''දියපරගහවත්ත, ඇටඹගහවත්ත, හකුරුගේමුන්දෙණිය නොහොත් දෙල්ගහලන්ද, මිල්ලගහවත්ත සහ මාකේවිටගේ ක්‍රිස්ටියන් පෙරේරා විදානරාලගේවත්ත නොහොත් නැදුන්ගහවත්ත '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. යූ. විජේතුංග යන අය විසින් සාදන ලද 2006 සැප්තැම්බර් මස 24 දාතම හා අංක 8997/2006 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාසිහේන පාර, නැගෙනහිරට : දැන් ඩී. සී. පී. රාජසේකරගේ අංක 14 දරන පරිශ්‍රයන් දකුණට : අඩි හයේ පළල දෙවට පාර සහ බස්නාහිරට : ජයවර්ධනගේ ඉඩම සහ දැන් එල්. ඩී. ඩී. වික්‍රමසිංහගේ ලොට් 8 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් අටයි දශම හතයි අටක් (A:0, R:0, P:38.78)විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 8997/2006 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 224/118 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,

10 - 941

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

සමගි ගෘප්.
ගිණුම් අංකය : 0021 1000 4454.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018.06.28 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් අනුරාධපුරය ප්‍රසිද්ධ නොතරිස් ඒ. වී. ඒ. දිසානායක යන අය විසින් ලියා සහතික කරන ලද 2005 පෙබරවාරි මස 28 දාතම හා අංක 3636 දරන සහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 අගෝස්තු මස 20 දාතම සහ අංක 1482 දරන සහ 2008 දෙසැම්බර් 30 දාතම හා අංක 2205 දරන බැඳුම්කර දෙකම, අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. ඒ. දිසානායක යන අය විසින් ලියා සහතික කරන ලද 2012 මැයි මස 28 දාතම හා අංක 7186 සහ 2016 මැයි මස 20 දාතම හා අංක 8712 දරන උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇප කොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "සමගි ගෘප් " යන ව්‍යාපාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන වැලිහේන හේවා ගමගේ ශිරෝෂන චන්ද්‍රකුමාර යන අය බන්ධනදායීන් පැහැර ඇති හෙයින් ද,

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් 2015 ඔක්තෝබර් මස 19 දාතම හා අංක SB/021/MM/328 දරන යන්ත්‍රසූත්‍ර උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇප කොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල අයිතීන් යන්ත්‍රසූත්‍ර සහ සවිකිරීම් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "සමගි ගෘප් " යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන වැලිහේන හේවා ගමගේ ශිරෝෂන චන්ද්‍රකුමාර යන අය බන්ධනාදායීන් පැහැර ඇති හෙයින් ද,

එකී අංක 3636, 1482, 2205, 7186 සහ 8712 දරන උකස් බැඳුම්කර සහ අංක SB/021/MM/328 දරන යන්ත්‍රසූත්‍ර උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් දෙකෝටි හය ලක්ෂ තිස්හත් දහස් හත්සිය පනස් හයයි ශත හතලිස් තුනයි (රු. 20,637,756.43) මුදලක් 2018 මැයි මස 31 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙකෝටි හයලක්ෂ තිස් හත් දහස් හත්සිය පනස් හයයි ශත හතලිස් තුනයි (රු. 20,637,756.43) මුදල ද, 2018 ජුනි මස 01 වැනි දින සිට එකී අංක 3636, 1482, 2205, 7186 සහ 8712 දරන උකස් බැඳුම්කර සහ අංක SB/021/MM/328 දරන යන්ත්‍රසූත්‍ර උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් අසූඅට ලක්ෂ හැත්තෑ දහසක (රු. 8,870,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට එකොළහයි දශම පහක් (11.5%), තවත් රුපියල් විසිහත් ලක්ෂයක (රු. 2,700,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%), තවත් රුපියල් හතලිස් පන් ලක්ෂයක (රු. 4,500,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) සහ තවත් රුපියල් විසි දෙලක්ෂ හැට දහසක (රු. 2,260,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නමයයි දශම පහක් (9.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 3636, 1482, 2205, 7186 සහ 8712 උකස් බැඳුම්කර සහ අංක SB/021/MM/328 දරන යන්ත්‍රසූත්‍ර උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසි කරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකණා ලියායුතු යැයි 1990 අංක 04 දරන බැංකු ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**පළමු උපලේඛනය**

1. උතුරු මැද පළාතේ, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත, නැගෙනහිර ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ නුවරගම් කෝරළේ අංක 266 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මහ නෙලුබැව ග්‍රාමයේ පිහිටි බලයලත් මානක තැන පී. බී. ඉලංගසිංහ යන අය විසින් සාදන ලද 2000 මාර්තු මස 06 දාතම හා අංක 2000/AN/43 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ISPP3 හි ලොට් 1047, නැගෙනහිරට : අංක 2000/AN/43 දරන පිඹුරේ ලොට් 2, දකුණට : ISPP3හි ලොට් 1065 සහ බස්නාහිරට :ISPP3 හි ලොට් 1074 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි හතරයි දශම හයයි බිංදුවක් (A:0, R:1, P:24.60) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සමග වෙළුම/පත්‍රිරුව LDO 601/92 යටතේ අනුරාධපුරය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

උතුරු මැද පළාතේ, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත, නැගෙනහිර ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ නුවරගම් කෝරළේ අංක 266 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මහ නෙලුබැව ග්‍රාමයේ පිහිටි බලයලත් මානක තැන නයන බණ්ඩාර ඒකනායක යන අය විසින් සාදන ලද 2012 මාර්තු මස 25 දාතම හා අංක 797 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 1

වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ISPP3 හි ලොට් 1047, නැගෙනහිරට : අංක 2000/AN/43 දරන පිඹුරේ ලොට් 2, දකුණට : ISPP 3හි ලොට් 1065 සහ බස්නාහිරට : ISPP3 හි ලොට් 1074 (පාර සහ ඇළ සඳහා වෙන්කිරීම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි හතරයි දශම හයයි බිංදුවක් (A:0, R:1, P:24.60) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම එකයි හයයි තුනක් (හෙක්ටයාර් 0.163) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග ය.

2. උතුරු මැද පළාතේ, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත, නැගෙනහිර ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ නුවරගම් කෝරළේ අංක 266 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මහ නෙලුබෑව ග්‍රාමයේ පිහිටි බලයලත් මානක තැන පී. බී. ඉලංගසිංහ යන අය විසින් සාදන ලද 2000 මාර්තු 06 දාතම හා අංක 2000/AN/43 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ISPP3 හි ලොට් 1047 සහ 1048, නැගෙනහිරට : ISPP 3හි ලොට් 1048, දකුණට : ISPP3 හි ලොට් 1065 සහ බස්නාහිරට : අංක 2000/AN/43 දරන පිඹුරේ හි ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් තුනයි දශම හතරක් (A:0, R:0, P:33.4) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග වෙළුම/පත්‍ර්ඉරුව LDO 594/63 යටතේ අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

උතුරු මැද පළාතේ, අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාත, නැගෙනහිර ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ නුවරගම් කෝරළේ අංක 266 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මහ නෙලුබෑව ග්‍රාමයේ පිහිටි බලයලත් මානක තැන නයන බණ්ඩාර ඒකනායක යන අය විසින් සාදන ලද 2012 මාර්තු 25 දාතම හා අංක 797 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන්කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ISPP3 හි ලොට් 1047 සහ 1048, නැගෙනහිරට : ISPP හි ලොට් 1048, දකුණට :ISPP3 හි ලොට් 1065 සහ බස්නාහිරට : අංක 2000/AN/43 දරන පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් තුනයි දශම හතරයි බිංදුවක් (A:0, R:0, P:33.40) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි අටයි හතරක් (හෙක්ටයාර් 0.084) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග ය.

උකස් බැඳුම්කර අංක 3636, 1482, 2205, 7186 සහ 8712 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.

**දෙවන උපලේඛනය**

Intelligence color sorter machine

| | | |
|---|---|---|
| Machine Model | - | 6SXM - 63 |
| Power | - | 1.0 |
| Weight | - | 350 Kg |
| Serial No. | - | C201506013 |
| Voltage | - | 220V |
| Air Pressure | - | 0.5 Mpa - 0.8 Mpa |
| Factory Date | - | 28/08/2015 |

අංක SB/021/MM/328 දරන යන්ත්‍රසූත්‍ර උකස් බැඳුම්කරය මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,

10 - 948

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

දම්මික ගාමන්ට්ස්.
ගිණුම් අංකය : 0202 1000 2503.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2020.09.24 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඩී. එම්. විතානගේ යන අය විසින් ලියා සහතික කරන ලද 2017 නොවැම්බර් මස 08 දාතම හා අංක 1898 දරන බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනවල මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "දම්මික ගාමන්ට්ස්" වන ව්‍යාපාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන රුබසිංහ කංකානමගේ දම්මික නිශාන්ත යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 1898 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තුන් කෝටි පනස් දෙලක්ෂ අනූ නම දහස් අටසිය තිහයි ශත හැට එකක (රු. 35,299,830.61) මුදලක් 2020 සැප්තැම්බර් මස 07 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තුන් කෝටි පනස් දෙලක්ෂ අනූ නම දහස් අටසිය තිහයි ශත හැට එකක (රු. 35,299,830.61) මුදල ද, 2020 සැප්තැම්බර් මස 08 වැනි දින සිට අංක 1898 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙකෝටි හැත්තෑ හය ලක්ෂ හතළිස් හය දහස් පන්සිය පනස් හතයි ශත අනූ එකක (රු. 27,646,557.91) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%), රුපියල් හත් ලක්ෂ

තිස් දෙදහස් අටසිය හැත්තෑ අටයි ශත එකක (රු. 732,878.01) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම පහක් (14.5%) මා තවත් රුපියල් දහ නම ලක්ෂ හැත්තෑ එක් දහස් අටසිය හැට නමයයි ශත විසි පහක (රු. 1,971,869.21) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොලිය ද, දන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා අංක 1898 දරන එකී උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසි කරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියායුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකි සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**ඉහත කී උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාමයේ පිහිටි සුමනතිස්ස මාවත, වරිපනම් අංක 87 දරන "චන්ද්‍රනගර්වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් මස 19 දාතම හා අංක 189/2003 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොටු ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 2, නැගෙනහිරට : ලොට් 11, දකුණට : එස්. ඇඩ්මන් සිංඤෝ විසින් හිමිකම් කියන දේපළ, බස්නාහිරට : ලොට් R1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (A:0, R:0, P:10) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සමග අංක 189/2003 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 1255/07 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාමයේ පිහිටි සුමනතිස්ස මාවත, වරිපනම් අංක 91 දරන "චන්ද්‍රනගර්වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් මස 19 දාතම හා අංක 189/2003 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණු කොටු ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් R2, නැගෙනහිරට : ලොට් 11, දකුණට : ලොට් 1, බස්නාහිරට : ලොට් R1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (A:0, R:0, P:10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සමග අංක 189/2003 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 683/78 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාමයේ පිහිටි සුමනතිස්ස මාවත, වරිපනම් අංක 85/41 දරන "චන්ද්‍රනගර්වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් මස 19 දාතම හා අංක 189/2003 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 11 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් R2, නැගෙනහිරට : ලොට් 12, දකුණට : එම්. කේ. සිරිසේන හිමිකම් කියන ඉඩම සහ එස්. ඇඩ්මන් සිංඤෝ විසින් හිමිකම් කියන දේපළ, බස්නාහිරට : ලොට් 1 සහ 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (A:0, R:0, P:10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සමග අංක 189/2003 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 810/21 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 189/2003 දරන පිඹුරේ නිරූපිත ලොට් R1 (අතුරුගිරිය පාර දිගේ වෙන් කිරීම), ලොට් R2 (මීටර 9 පළල පාර සඳහා වෙන් කිරීම) ලොට් R3, R4, R5 සහ R6 යන සියල්ල දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සහ එකී අංක 189/2003 දරන පිඹුරේ නිරූපිත ලොට් D1 සහ D2 වශයෙන් ලකුණු කොට ඇති කානුව භාවිතා කිරීමේ අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,

10 - 942

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.